**බුද්ධශාසන අරමුදල - 2012**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතු කොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 උසස් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව නොවීම්

උසස් ගිණුම්කරණ පරිචයන්ට අනුව මූල්‍ය ප්‍රකාශ සමඟ අනාවරණය කල යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති කිසිවක් මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලට අයත් අනුරාධපුර පූජනීය පෙදෙසේ බසවක්කුලමේ පිහිටි අක්කර 02 රූඩ් 01 පර්චස් 13 ක වපසරියක් සහිත ඉඩමේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනය තුළ දක්වා තිබුණේ රු.10,000 ක් ලෙසය. මෙම ඉඩමේ සාධාරණ තක්සේරු වටිනාකම සහ ඉඩම බදු දීම තුළින් ලැබිය යුතු කුලී ආදායම ගිණුම් වාර්තා වල පෙන්නුම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අරමුදල විසින් මුද්‍රණය කර විකුණනු ලබන පොත්වලට අදාල ලාභය හා පොත් තොග වටිනාකම් පැහැදිලිව පෙන්වන පරිදි වෙනම ගිණුම් පවත්වා නොතිබුණි.

(ඇ) ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී ආදායම් රු.13,900,954 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ විගණිත ගිණුම් ශේෂ 08 ක්, සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශන වල ආරම්භක ශේෂ වශයෙන් ඉදිරියට ගෙන ඒමේදී ගිණුම් ශේෂ 02 ක් රු.87,292 ක් වැඩියෙන්ද ගිණුම් ශේෂ 06 ක් රු.9,356,134 අඩුවෙන්ද ගිණුම්වල දක්වා තිබුණි.

(ඉ) මහජන බැංකුවේ යුනියන් පෙදෙස ශාඛවේ බුද්ධශාසන අරමුදල නමින් ඇති රු. මිලියන 30 ක් වටිනා ස්ථාවර තැන්පතුව ගිණුම් වාර්තා වලට ගෙන නොතිබුණි.

(ඊ) මහජන බැංකුවේ ආයෝජනය කරන ලද අනෙකුත් ස්ථාවර තැන්පතුවල ශේෂය රු.2,406,644 ක් වැඩියෙන් ගිණුම් වාර්තාවල දක්වා තිබුණි.

(උ) අරමුදල විසින් මාසික බැංකු සැසදුම් ප්‍රකාශ පිළියෙල කර තිබුණද විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මුදල් පොත මාසිකව තලනය කර නොතිබුණි. ඒ අනුව අදාළ බැංකු සැසදුම් ප්‍රකාශන කුමන ශේෂ පදනම් කරගෙන පිළියෙල කලේද යන්න විගණනයට අනාවරණය නොවූයෙන් බැංකු සැසදුම් ප්‍රකාශ වල නිවැරදිතාවය සනාථ කර ගැනීමට නොහැකි විය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැංකුවේ පැවති මුදල් ශේෂය රු.12,670,606 ක් විය.

(ඌ) 2008 වර්ෂයේ ශේෂ පිරික්සුමෙහි රු.126,679 ක්වූ නොසැසඳෙන ශේෂය ගැලපුම් ගිණුමක හරට සටහන් කර, එම ශේෂය හඳුනා ගැනීමකින් තොරව 2009 වර්ෂයේ බුද්ධශාසන අරමුදල් ගිණුමට කපා හැර තබුණි. 2012 දෙසැම්බර් 31 දින වන විටත් එම ශේෂය හඳුනාගෙන ගිණුම් වාර්තා වල අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) ගිණුම් වර්ෂය සහ ඉකුත් වර්ෂ වෙනුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට විගණන ගාස්තු ගිණුම්වල ප්‍රතිපාදනය කර නොතිබුණි.

### 1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පෞද්ගලක පොත් මුද්‍රණ ආයතනයකින් පොත් මුද්‍රණය කිරීම වෙනුවෙන් ලැබිය යුතුව තිබුණු රු.20,513,820 ක් 2011 වර්ෂයේ සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් ඉදිරියෙන් දක්වා ඇති අදාල සාක්ෂි ඉදිරිපත් නොවූයෙන් එම ගනුදෙනු සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

| | ගනුදෙනු විස්තර | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|---|
| (අ) | තැන්පත් නැවත ලබා ගැනීම. (සාමණේර කැපකරු දායක ක්‍රමය) | 12,000,000 | මුදල් නැවත ලබා ගැනීමට අදාල පාලක මණ්ඩලයේ අනුමැතිය හා අරමුදල් යෙදවීම් විස්තර. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පොත් තොග විනාශ වීම්. | 262,286 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| (ඇ) | ඉතිරි පොත් තොගය. | 1,744,765 | - එම - |
| (ඈ) | භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පත් වල ආයෝජන. | 353,043,425 | ආයෝජන වල විස්තර ඇතුලත් ලේඛන/ආයෝජන ලෙජරය සහ විස්තරාත්මක උපලේඛන. |
| (ඉ) | නැදිමාල බෞද්ධ මධ්‍යස්ථානය භාරයේ ඇති පොත්. | 8,248,169 | සමීක්ෂණ මණ්ඩල වාර්තා, භාරයේ ඇති බව කරන ලද සනාථ කිරීම්. |
| (ඊ) | ගෙවිය යුතු සාමනේර ආයතන වාරික. | 795,000 | ගණනය කිරීම් විස්තර. |
| (උ) | ගෙවිය යුතු පොළී | 107,218 | - එම - |
| (ඌ) | අත්තිකාරම් ගෙවීම් | 8,569,440 | ගෙවීම් විස්තර හා ශේෂ සනාථ කිරීම්. |

## 1.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණයන්ට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාස යනාදියට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1990 අංක 35 දරන බුද්ධශාසන අරමුදල පනත: | |
| | 3.1 වගන්තිය සහ 3.1(5) වගන්තිය | අරමුදලේ පරිපාලනය, කළමණාකරණය සහ පාලනය එහි පාලක මණ්ඩලය වෙත පැවරී ඇති අතර මණ්ඩලයේ රැස්වීම් සහ රැස්වීම් වලදී අනුගමනය කරන කාර්ය පටිපාටිය මණ්ඩලය විසින් විධිමත් කරනු ලැබිය හැකිය. එසේ වුවත් සමාලෝචිත වර්ෂය තුල පාලක මණ්ඩලය රැස්ව තිබුණේ එක් වතාවක් පමණක් වන අතර මණ්ඩලය කරනු ලබන කාර්යන් පිළිබඳ පටිපාටි සකස්කර නොතිබුණි. |

| | |
|---|---|
| 4.1 වගන්තිය | පාලක මණ්ඩලයට සහාය වීම සහ උපදෙස් දීම සඳහා ත්‍රෛ නිකායක මහානායක හිමිවරු සිව් නමක්, අමාත්‍යාංශ ලේකම්, බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස් සහ ජනාධිපති තුමා විසින් පත්කරනු ලබන සාමාජිකයන් 05 දෙනෙකුගෙන් යුත් සමාජිකයින් 11 දෙනෙකුගෙන් සමන්විත උපදේශක කමිටුවක් පත්කල යුතු වුවත් එම උපදේශක මණ්ඩලය පත්කර නොතිබුණි. |
| 6 වගන්තිය | විදේශිය වුවද දේශිය වුවද කවර වූ හෝ ප්‍රභවයකින් ලැබෙන මුදල් භාර ගැනීම සහ බුද්ධශාසනය ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම අරභයා ඉතාමත්ම යෝග්‍ය යැයි මණ්ඩලය සලකන අකාරයට එසේ සලකනු ලබන කාර්යය සඳහා ඒ මුදල් යෙදවීම අරමුදලේ කාර්යය විය යුතුය. එසේ වුවත් 2004 වර්ෂයේ ඇති වූ සුනාමි අනතුරින් හානියට පත් වූ විහාරස්ථාන ගොඩනැගීම වෙනුවෙන් ලැබී තිබුණු රු.1,348,796 ක මුදලක් 2013 දෙසැම්බර් 31 දක්වාම අදාල අරමුණට යොදවා නොතිබුණි. |
| 12.3 වගන්තිය | අරමුදලේ ගිණුම් විගණනය කිරීමෙහිලා විගණකාධිපතිවරයා විසින් දරණු ලබන වියදම් පියවීම පිණිස මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් පාරිශ්‍රමිකයක් අරමුදලේ ආදායමෙන් විගණකාධිපතිවරයාට ගෙවිය යුතු වුවද එවැනි ගෙවීමක් කර නොතිබුණි. |
| 17 වගන්තිය | අරමුදලේ ආදායම් බදුවලින් නිදහස් වුවද ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පත් සඳහා වූ පොළී ආදායමෙන් අඩුකරගෙන තිබුණු රු.347,381 ක රැඳවුම් බදු මුදල අරමුදලට බැර කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

(ආ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පී.එෆ් 423 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය:

| | |
|---|---|
| (i) 4.1 (අ), (ආ), (ඇ) ජේද | අරමුදලෙහි අරමුණුවලට අනුකූලව අයවැය ලේඛනයක් පිළියෙළ කර ගරු අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) 4.2 (ආ) ජේදය | අරමුදල වෙත ලැබෙන සියලුම ලැබීම් වෙනුවෙන් ලදුපත් නිකුත් කර නොතිබුණු අතර ආයෝජන පිළිබඳ ලේඛනයක්ද නඩත්තු කර නොතිබුණි. |
| (iii) 4.2 (ඇ) ජේදය | බැංකු ගිණුම් පිළිබඳ පොත් පත් හා වාර්තා සසඳා කාර්තු වශයෙන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කල යුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (iv) 4.2 (ඊ) ජේදය | අරමුදල සම්බන්ධව නිවැරදි පොත්පත් සහ ලේඛන නඩත්තු කරමින් සතුටුදායක ගිණුම් ක්‍රමයක් පවත්වාගෙන යා යුතුය. එසේ වුවත් සකස් කර තිබුණු ගිණුම් වාර්තා හා ඒ ආශ්‍රිත ලේඛන වල මෙම වාර්තාවේ 02 ජේදයේ විස්තර කර ඇති පරිදි ප්‍රමාණාත්මක අඩුපාඩු නිරීක්ෂණය විය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ ආදායම සහ වියදම පිළිවෙළින් රු.29,966,509 ක් හා රු.2,241,441 ක් වශයෙන් එහි මෙහෙයුම් කටයුතු වල අතිරික්තය රු.27,725,095 ක් විය. ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම සහ වියදම පිළිවෙළින් රු.32,085,975 ක් සහ රු.5,256,606 ක් වූයෙන් ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.26,829,369 ක් විය. මේ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.895,726 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු පරිත්‍යාගයක් අරමුදලට ලැබී නොතිබුණි. අරමුදල කළමණාකරණයේ පවතින අකාර්යක්ෂමතාව හා නොසැලකිලිමත්භාවය අරමුදල වෙත ලැබෙන මහජන පරිත්‍යාග ක්‍රමානුකූලව අඩුවීමටද හේතුවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයෝජන වටිනාකම රු. මිලියන 353 ක් වූ අතර එයින් රු. මිලියන 30 ක ආදායමක් ලැබී තිබුණි. ආයෝජන ආදායමට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මුළු වියදම සියයට 7.47 ක් පමණක් විය. එසේම අරමුදල පිහිටවීමේ අරමුණු ඉටුකර ගැනීම පිණිස සැලැස්මක් අනුව කටයුතු නොකිරීම හේතුවෙන් අරමුදලේ සමස්ථ ආදායමෙන් සියයට 92 කට වැඩි ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂයේදී ද ඉකුත් වර්ෂයේදී ද ඌන උපයෝජිතව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සාමණේර කැපකරු දායක ක්‍රමයට අයත් රු. මිලියන 28 ක මූලික ආයෝජනය තුලින් ලැබෙන ප්‍රතිලාභ උපයෝගී කරගෙන සාමණේර කැපකරු දායක ක්‍රමය ක්‍රියාත්මක කළ යුතු වුවත් ඉකුත් වර්ෂ 05 ට අදාළව ලැබී තිබූ රු.15,926,160 ක පොළී අදායමෙන් දායක ක්‍රමය සඳහා රු.2,595,000 ක මුදලක් පමණක් වියදම් කර තිබුණි. එය අදායමෙන් සියයට 16.29 ක් විය. කාර්ය සාධනය පරීක්ෂා කිරීමේ දී එය නිසි පරිදි ක්‍රියාත්මක වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) 2012 දෙසැම්බර 31 දිනට බුද්ධශාසන අරමුදල සතුව රු මිලියන 353 ක මුදලක් රජයේ බැංකු කිහිපයක ආයෝජනය කර තිබුණ ද එම ස්ථාවර තැන්පතු වාර්ෂිකව අළුත් කිරීම හෝ නැවත ආයෝජනය කිරීමට සම්බන්ධ තොරතුරු කිසිවක් අදාළ ලිපිගොණු තුළ නොතිබුණි.

(ඇ) බුද්ධශාසන අරමුදලේ පාලක මණ්ඩලය විසින් ගන්නා ලද තිරණයක් අනුව පාලි අට්ඨකථා පොත් හා වෙනත් බෞද්ධ පොත් සිංහලට පරිවර්තනය කිරීම, මුද්‍රණය කිරීම සහ විකිණීම යන කටයුතු පෞද්ගලික මුද්‍රණාලයකට පවරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2012 දෙසැම්බර් 31 දිනට පොත් මුද්‍රණය කර විකිණීමෙන්, අරමුදලට ලැබිය යුතු ශේෂය රු.3,696,212 ක මුදල අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ii) 2013 ඔක්තෝබර් 31 වන විට පොත් මුද්‍රණය කර වර්ෂය 03 ක් ඉක්ම ගොස් ඇතත් මුද්‍රණය කරනු ලබන පොත් විධිමත්ව භාර ගෙන ගබඩාකර ගැනීමේ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii) පරිවර්තනය සහ මුද්‍රණය කල පොත් සහ විකුණන ලද පොත් සංඛ්‍යාව, ඉතිරි පොත් සංඛ්‍යාව, වෙන් වෙන්ව හඳුනාගත හැකි පරිදි අරමුදල විසින් ලේඛන සකස් කර නොතිබුණු අතර පෞද්ගලික ආයතනයක් විසින් සපයනු ලබන වාර්තා පදනම්ව ගිණුම් සකස් කර තිබුණි.

(iv) මේ අනුව පොත් පරිවර්තනය සහ මුද්‍රණය කිරීම සම්බන්ධව විධිමත් පාලනයක් පවත්වා ගැනමට අරමුදල අපොහොසත් වීම හේතුවෙන්, අවිධිමත් ආකාරයට පොත් පරිවර්තනය සහ මුද්‍රණය කර විකිණීමෙන් එම පුද්ගලික ආයතනයට අදායම ඉපැයමට අවස්ථාව සැලසී තිබූ අතර මේ පිළිබඳ පාලක මණ්ඩලයේ අවධානය යොමු වී නොතිබුණි.

(v) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයයේ 3.2 වගන්තිය ප්‍රකාරව බෞද්ධ පොත් පරිවර්තනය සහ මුද්‍රණය කිරීම, විකිණීම සම්බන්ධයෙන් මිල කැඳවීමකින් තොරව පෞද්ගලික ආයතනයක් වෙත භාර දී ඒ සඳහා 2009 සිට 2011 දක්වා වර්ෂ 03 ක කාලයක් තුල රු.8,569,440 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි.

## 3.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

(අ) රු.317,400 ක් වටිනා බුද්ධ ජයන්ති කාස තොගය, විකිණීමෙන් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) විවිධ අරමුණු වෙනුවෙන් අරමුදල වෙත පරිත්‍යාග කරන ලද අරමුදල් 12 කට අයත් එකතුව රු.1,448,096 ක් වූ මුදල් අදාළ අරමුණු සඳහා යෙදවීමකින් තොරව වර්ෂ 18 ත් 20 ත් අතර කාලයක් මුළුල්ලේ නිෂ්ක්‍රීයව පැවතුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ් 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ජේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 2 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2013 ඔක්තෝබර් 07 දිනදීය. 2011 ඔක්තෝබර් 18 දින පැවති රාජ්‍ය ගිණුම්කාරක සභාවේදී නියමිත දිනට ගිණුම් ඉදිරිපත් කරන ලෙසට ලබා දුන් නියෝගද නොසලකා හැර ගණුම් ඉදිරිපත් කිරීම ප්‍රමාද කර තිබුණි.

### 4.2 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඩ්ඩී/12 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ 05 ජේදය ප්‍රකාරව අරමුදලේ දැක්ම හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 4.3 ක්‍රියාකාර සැලැස්ම

වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 4.4 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර අරමුදලේ ලේකම්වරයා දැනුවත් කරන ලද අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) අරමුදල් ආයෝජනය
(ආ) ගිණුම්කරණය
(ඇ) කාර්යසාධනය
(ඈ) පොත් මුද්‍රණය, විකිණීම හා ගබඩාකරණය.
(ඉ) පොත්පත් හා ලේඛන විධිමත්ව පවත්වාගෙන යාම.
(ඊ) වත්කම් ප්‍රත්‍යාගණනය
(උ) අයවැය පාලනය